**කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II**

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

1. පහතරට අතරමැදි කෘෂි දේශගුණික කලාපයේ සංස්ථාපිත ගොවි ගම්මානයක ගොවි මහතුන් ප්‍රධාන වශයෙන් පොල් වගාව සහ සත්ත්ව පාලනය සිදුකරන අතර අපනයනය පිණිස පලතුරු සැකසුම් ආයතනයකට අලෙවි කිරීම සඳහා අන්නාසි, අඹ සහ කෙසෙල් වගාව ද සිදුකරනු ලැබේ.

(i) (a) ශ්‍රී ලංකාව ‘කෘෂි දේශගුණික කලාප’ කීයකට බෙදා තිබේද?
(b) ‘පහතරට අතරමැදි කෘෂි දේශගුණික කලාපය’ හඳුන්වන සංකේතය ලියා දක්වන්න.

(ii) (a) ප්‍රධාන බෝගය ලෙස පොල් වගා කර ඇති ඉඩමක, අන්නාසි සහ කෙසෙල් ද වගා කළ හැකි ය. එම වගා රටාව හඳුන්වන්න.
(b) පාංශු ජල සංරක්ෂණය සඳහා ඉහත වගාවේ පේළි අතර යෙදිය හැකි ස්වාභාවික වසුන් වර්ග **දෙකක්** ලියා දක්වන්න.

(iii) (a) ගොඩ බෝග වගාව සඳහා මූලික බිම් සකස් කිරීමට යොදාගන්නා යන්ත්‍ර බලයෙන් ක්‍රියා ක්‍රියාකරවිය හැකි ප්‍රාථමික කෘෂි උපකරණයක් නම් කරන්න.
(b) රටකජු හා බතල වගාවල වැටි සහ කාණු සකස් කිරීම කාර්යක්ෂමව සිදු කළ හැකි ද්විතීයික බිම් සැකසීම් උපකරණයක් සඳහන් කරන්න.

(iv) (a) අන්නාසිවලින් නිපදවා ගත හැකි පරිරක්ෂිත ආහාර වර්ග **දෙකක්** ලියන්න.
(b) උෂ්ණත්වය වැඩි කිරීමෙන් එළ කිරි කල් තබා ගන්නා ප්‍රධාන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(v) (a) සත්ත්ව නිෂ්පාදන මගින් ලබා ගත හැකි මිනිස් සිරුරේ පෝෂණයට අත්‍යවශ්‍ය ප්‍රධාන පෝෂක සංඝටකය නම් කරන්න.
(b) පලතුරුවල අඩංගු ප්‍රධාන සීනි වර්ගය නම් කරන්න.

(vi) (a) අඹ අස්වනු නෙළූ පසු අඹ කිරිවලින් ඵලවලට සිදුවන හානිය වැළැක්වීමට සිදුකළ යුතු ප්‍රතිකර්මය ලියන්න.
(b) කෙසෙල්, ඇපල් වැනි පලතුරු කැපූ විගස දුඹුරු පැහැ වීමට හේතුවන රසායනික ක්‍රියාව කුමක් ද?

(vii) (a) ගොවිපොළට අවශ්‍ය බද්ධ අඹ පැළ ලබා ගැනීම සඳහා ග්‍රාහක ලෙස යොදා ගත හැකි අඹ ප්‍රභේද **දෙකක්** ලියන්න.
(b) අන්නාසි වගාවට හානි කරන කෘමි පළිබෝධයෙක් නම් කරන්න.

(viii)(a) කුකුල් ආහාර සලාකයක කාබෝහයිඩ්‍රේට් ලබා දීම සඳහා යොදාගත හැකි ආහාර සංඝටක **දෙකක්** නම් කරන්න.
(b) බැක්ටීරියාවක් මගින් කුකුළන්ට වැළඳෙන රෝගයක් නම් කර එම රෝගයේ රෝග කාරකයා නම් කරන්න.

(ix) (a) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරි නිෂ්පාදනය සඳහා ඇති කරනු ලබන ගව වර්ග **දෙකක්** සඳහන් කරන්න.
(b) ගවයින්ට වැළඳෙන වසංගත රෝග **දෙකක්** නම් කරන්න.

(x) (a) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ප්‍රමිතිය ලබා ගැනීම අනිවාර්ය කර ඇති නිෂ්පාදනයක් නම් කරන්න.
(b) රටවල් අතර හුවමාරු වන භාණ්ඩ සඳහා අවශ්‍යවන ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිති සහතිකය කුමක්ද?

(දෙවැනි පිටුව බලන්න)

**2.** මනා බිම් සැකසීම හා නිවැරදි තවාන් ශිල්ප ක්‍රම යොදා ගැනීමෙන් ඉහළ බෝග අස්වැන්නක් ලබාගත හැකි ය.

**(i)** (a) බිම් සැකසීමේ අරමුණු **හතරක්** සඳහන් කරන්න.

(b) ද්විතියික බිම් සැකසීමේ දී සිදු කරන පස හා සම්බන්ධ ප්‍රධාන කාර්ය **දෙකක්** ලියන්න.

**(ii)** (a) බෝග සංස්ථාපනය කිරීමේ දී නිවැරදි ගැඹුර හා පරතරය භාවිත කිරීමේ ප්‍රයෝජන **හතරක්** ලියන්න.

(b) බෝග වගාවේ දී සෘජුවම ක්ෂේත්‍රයේ සංස්ථාපනය හා සැසඳීමේ දී බීජ තවාන් කර ලබාගත් පැළ සිටුවීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

**(iii)** එළවළු පැළ තවානක් නඩත්තු කිරීමේ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(a) ජල සම්පාදනය

(b) පැළ දැඩි කිරීම

**3.** බෝගවලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා මනා පාංශු කළමනාකරණය වැදගත් වේ.

**(i)** (a) පාංශු වයනයේ කෘෂිකාර්මික වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(b) බෝග වගාවට වඩාත් සුදුසු පාංශු ව්‍යුහ ආකාරය කුමක්ද?

**(ii)** (a) පසේ කැටායන හුවමාරුව යනු කුමක්දැයි හඳුන්වන්න.

(b) කැටායන හුවමාරුව බෝග වගාවේ දී වැදගත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(iii)** (a) බෝග වගා කිරීමේ දී පස තුළට ජලය කාන්දුවීම වැඩි කිරීම මගින් පාංශු ඛාදනය අඩුකළ හැකි ය. පස තුළට ජලය කාන්දු වීම වැඩි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ හා වියළි කලාපයේ බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩයක් බැගින් සඳහන් කරන්න.

**4.** බෝග වගාවෙන් ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පෝෂක ද්‍රව්‍ය නිසි අයුරින් ලබාදීම වැදගත් වේ.

**(i)** ශාක පෝෂණයේ දී පසෙන් ලබා ගන්නා,

(a) මහා මූල ද්‍රව්‍ය **දෙකක්**

(b) ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

**(ii)** බෝග වගාවේ දී රසායනික පොහොර, මිශ්‍ර පොහොර හා අමිශ්‍ර පොහොර යොදනු ලැබේ. මිශ්‍ර පොහොර හා අමිශ්‍ර පොහොර අතර වෙනස සඳහන් කර ඒවාට නිදසුන බැගින් ලියන්න.

**(iii)** බෝග වගාවේ ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීමට මනා ලෙස ජල කළමනාකරණය කළ යුතු ය.

(a) පාංශු ජලය සංරක්ෂණය කිරීමේ ක්‍රම **දෙකක්** ලියන්න.

(b) බෝග වගාව සඳහා ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු **දෙකක්** ලියන්න.

**5.** බෝග වගාවේ ඵලදායීතාව අඩු වීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස වල්පැළෑටි, ශාක රෝග , කෘමි හා කෘමි නොවන පළිබෝධවල බලපෑම දැක්විය හැකි ය.

**(i)** (a) වල් පැළෑටි මගින් බෝගයට සිදුවන අහිතකර බලපෑම් හතරක් ලියන්න.

(b) ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටි දෙකක් නම් කරන්න.

**(ii)** (a) තවාන් පැළවලට බහුලව වැළඳෙන රෝගයක් නම් කර එහි රෝග කාරකයා සඳහන් කරන්න.

(b) එම රෝගයේ රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(තුන් වැනි පිටුව බලන්න)

**(iii)** (a) කුකර්බිටේසියේ කුලයේ බෝග ඵලවලට බහුලව හානි කරන පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමි පළිබෝධය නම් කරන්න.
(b) ඉහත කෘමි පළිබෝධය පාලනය සඳහා යොදාගත හැකි රසායනික නොවන ක්‍රම දෙකක් දක්වන්න.

**6.** ශ්‍රී ලංකාවේ සත්ත්ව ප්‍රෝටීන් අවශ්‍යතාව සැපිරීමෙහි ලා කුකුළු පාලනය ඉතා වැදගත් වේ.

**(i)** කුකුළන් ඇති කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය වන නිදැලි ක්‍රමයේ අවාසි **තුනක්** සඳහන් කරන්න.

**(ii)** ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීම පිණිස අතුරණුවක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

**(iii)** (a) ගවයින්ට වැළඳෙන බුරුළු ප්‍රදාහයේ රෝග කාරකය නම් කරන්න.
(b) එම රෝගයේ ප්‍රධාන රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

**7.** 'ආහාර පරිරක්ෂණය' මගින් අතිරික්ත නිෂ්පාදන අනාගත පරිභෝජනය සඳහා සංරක්ෂණය කරනු ලැබේ.

**(i)** (a) ආහාර නිෂ්පාදන වියළීමේ දී ආහාරයේ අඩංගු නිදහස් ජලය ඉවත් වේ. ආහාර වියළීමේ ක්‍රම **දෙකක්** නම් කර ඒ සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.
(b) ලැක්ටික් අම්ල පැසවීම මගින් පරිරක්ෂණය කෙරෙන ආහාර වර්ග **දෙකක්** නම් කරන්න.

**(ii)** (a) ආහාර ඇසුරුම් ලෙස වීදුරු බඳුන් භාවිත කිරීමේ වාසි **හතරක්** ලියන්න.
(b) 'අපූති තත්ව යටතේ ආහාර ඇසිරීම' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. ඒ සඳහා නිදසුනක් දෙන්න.

**(iii)** (a) ආහාර ඇසුරුමක ඉදිරිපස ලේබලයේ සඳහන් කළ යුතු ප්‍රධාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(b) කෘත්‍රිම වර්ණක මිශ්‍ර කරන ලද තේ කොළ හඳුනාගැනීමට නිවසේ දී සිදුකළ හැකි සරල ක්‍රියාකාරකමක් ලියන්න.

**පිළිතුරු**

1. **(i)** (a) IL **(ලකුණු 01)**
(b) හතයි **(ලකුණු 01)**

**(ii)** (a) අතුරු බෝග වගාව **(ලකුණු 01)**
(b) පිදුරු, කොහු බත්, බෝග අවශේෂ, වියළි තෘණ **(ලකුණු 1/2×2 = 01)**

**(iii)** (a) තැටි නගුල, කොකු නගුල, හැඩලැලි නගුල **(ලකුණු 01)**
(b) ඇලි වැටි දමනය (රිජරය) **(ලකුණු 01)**

**(iv)** (a) ජෑම්, කෝඩියල්, චට්නි **(ලකුණු 1/2×2 = 01)**
(b) පැස්ටරීකරණය, ජීවානුහරණය **(ලකුණු 1/2×2 = 01)**

**(v)** (a) ප්‍රෝටීන **(ලකුණු 01)**
(b) ලැක්ටෝස් **(ලකුණු 01)**

**(vi)** (a) උණු ජල ප්‍රතිකාරය (සෙල්සියස් අංශක 60 උණු වතුරෙන් සෝදා/ අත දැමිය හැකි උෂ්ණත්වය) පිසදා නටුව පහළට සිටින සේ තැබීම **(ලකුණු 1/2×2 = 01)**
(b) එන්සයිමීය ක්‍රියා, එන්සයිමීය ඔක්සිකරණය **(ලකුණු 01)**

**(vii)** (a) ඇටඹ, කොහුඅඹ, වල්අඹ **(ලකුණු 01)**
(b) පිටි මකුණා **(ලකුණු 01)**

**(viii)** (a) බඩ ඉරිඟු, හාල් නිවුඩු, සුනු සහල් **(ලකුණු 01)**
(b) පුල්ලෝරම් රෝගය, *Salmonella pullorum* **(ලකුණු 1/2×2 = 01)**

**(ix)** (a) සහිවාල්, රතු සින්දි, දේශීය ගව වරිග, දෙමුහුම් ගව වරිග **(ලකුණු 1/2×2 = 01)**
(b) ගව රක්තාශ්‍ර රෝගය, කාලගාත්‍රා රෝගය, කුර සහ මුඛ රෝගය **(ලකුණු 1/2×2 = 01)**

**(x)** (a) පානීය ජලය, අයිඩින් මිශ්‍ර මේස ලුණු, පොල් වතුර විනාකිරි, පලතුරු කෝඩියල් **(ලකුණු 01)**
(b) ISO **(ලකුණු 01)**

**(මුළු ලකුණු 20)**

2. **(i)** (a) පාංශු ව්‍යුහය, පාංශු වාතනය හා පසෙහි ජලවහනය දියුණු වීම / ඒ බෝගයට උචිත පරිදි භූමිය සකස් කිරීම / පසෙහි ඇති ගල් මුල් ආදිය පසෙන් ඉවත් කිරීම / පසට පොහොර මිශ්‍ර කිරීම / පළිබෝධ පාලනය කිරීම /භූගත වල් පැළෑටි කොටස් ඉවත් කිරීම **(ල.1/2×4= 02)**

(b) පස් කැට පොඩිකර සියුම් ලෙස සකස් කිරීම / පස මට්ටම් කිරීම / අවශ්‍ය පරිදි පාත්ති සැකසීම **(ල. 1×2=2)**

**(ii)** (a) ප්‍රරෝහණය පහසු වීම/ අතු පැතිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත්ව සැපයීම/ මුල් වර්ධනයට ප්‍රමාණවත් ඉඩකඩ ලැබීම/ ගසකින් තවත් ගසකට ඇතිවන සෙවණෙහි බලපෑම අඩු වීම/ පළිබෝධ හානි අවම වීම/ ශාක අතර තරගකාරීත්වය අඩුවීම **(ල. 1/2×4=02)**

(b) තවානෙහි දී පැළවලට ගැලපෙන ලෙස පරිසර තත්ත්ව පාලනය කළ හැකි ය/ ශක්තිමත් හා නිරෝගී පැළ වැඩි සංඛ්‍යාවක් නිපදවා ගත හැකි ය/ ඍජුවම ක්ෂේත්‍රයේ සිටුවීමට අපහසු කුඩා බීජවලින් පැළ නිපදවා ගත හැකි ය/ තවානේ කුඩා පැළ පහසුවෙන් රැක බලා ගත හැකි ය/ බද්ධ කිරීම සඳහා ග්‍රාහක පැළ ලබාගත හැකි ය. **(ල. 1/2×4=02)**

**(iii)** (a) ආරම්භයේ සිටම තවානට ජල සම්පාදනය කළ යුතු ය/ තවානට අනවශ්‍ය ලෙස ජලය යෙදීමෙන් වැළකිය යුතු ය/ වියළි කාලයේ දී නම් උදේ හා සවස ජලය සැපයිය යුතු ය/ හැකිනම් විසුරුමක් ලෙස වැඩි කාලයක් ජලය යෙදීම උචිත ය. **(ලකුණු 01)**

(පස් වැනි පිටුව බලන්න)

(b) තවානෙහි ඇති පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට ක්‍රමයෙන් හුරු කිරීම 'පැළ දැඩි කිරීම' ලෙස හඳුන්වයි/ පැළ තවානෙන් ගැලවීමට දින කිහිපයක සිට තවානට ජලය යොදන වාර ගණන අඩු කිරීම/ ජලය යොදන කාලාන්තර වැඩි කිරීම/ සූර්යාලෝකයට පැළ නිරාවරණය වන කාලය වැඩි කිරීම **(ලකුණු 01)**

**<u>(මුළු ලකුණු 10)</u>**

**3. (i)** (a)
* පසට ගැලපෙන බෝග තෝරා ගැනීම සඳහා
* වගාවට සුදුසු පරිදි වයනය දියුණු කර ගැනීම සඳහා
* බිම් සැකසීමට සුදුසු උපකරණ තෝරා ගැනීම සඳහා
* පාත්තිවල උස තීරණය කිරීම සඳහා
* උචිත ජල සම්පාදන ක්‍රම තෝරා ගැනීම සඳහා
* පාංශු සංරක්ෂණ ක්‍රම තෝරා ගැනීම සඳහා **(ලකුණු 01×01 = 01)**

(b) කැටිති ව්‍යුහය **(ලකුණු 01×01 = 01)**

**(ii)** (a) පාංශු කලිලවලට අධිශෝෂණය වී ඇති කැටායන පාංශු ද්‍රාවණයේ ඇති කැටායන සමග හුවමාරු වීමේ ක්‍රියාවලිය කැටායන හුවමාරුව නම් වේ. **(ලකුණු 01×02 = 02)**

(b)
* පොහොර ලෙස පසට යොදන පෝෂක රඳවා තබා ගැනීම
* අවශ්‍ය විට පාංශු ද්‍රාවණයට අයන මුදා හැරීම
* පස සාරවත් වීම
* ආම්ලික හා ක්ෂාරීයතාව යථා තත්ත්වයට පත් කිරීම **(ලකුණු 01×01 = 01)**

**(iii)** (a)
* පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම
* පාංශු ව්‍යුහය දියුණු කිරීම
* පාංශු පුනරුත්ථාපන බෝග වැවීම. (උදා : ගෝතමාලා) **(ලකුණු 01×03 = 03)**

(b) තෙත් කලාපය : රතු කහ පොඩ්සොලික් පස
වියළි කලාපය : රතු දුඹුරු පස **(ලකුණු 01×02 = 02)**

**<u>(මුළු ලකුණු 10)</u>**

**4. (i)** (a) N, P, K,Ca, Mg, S **(ලකුණු 01×02 = 02)**

(b) Zn,Cu, Mn, Mo, B, Fe, Cl, Ni **(ලකුණු 01×02 = 02)**

**(ii)** (a) අමිශ්‍ර පොහොර : ප්‍රධාන පෝෂක තුනෙන් එකක් පමණක් ඇත.
මිශ්‍ර පොහොර : ප්‍රධාන පෝෂක තුනෙන් දෙකක් හෝ තුනම අඩංගු වේ. **(ලකුණු 1/2×2 = 01)**

අමිශ්‍ර පොහොර : යූරියා, මියුරේට් ඔෆ් පොටෑෂ්, TSP
මිශ්‍ර පොහොර : වී වගාවේ TDM මිශ්‍රණය (බණ්ඩි පොහොර) **(ලකුණු 1/2×2 = 01)**

**(iii)** (a)
* පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම
* පසට වසුන් යෙදීම
* වල්පැළෑටි ඉවත් කිරීම
* අනවශ්‍ය අතු හා පත්‍ර ඉවත් කිරීම
* මතුපිටින් ඉවතට ගලා යන ජලයට බාධා කිරීම **(ලකුණු 01×02 = 02)**

(b)
* වගා කර ඇති බෝගය
* බෝගයේ වර්ධන අවස්ථාව
* පාංශු වයනය
* ජලය සැපයීමේ අරමුණු **(ලකුණු 01×02 = 02)**

**<u>(මුළු ලකුණු 10)</u>**

(හය වැනි පිටුව බලන්න)

5. (i) (a) පෝෂක, හිරු එළිය, ජලය හ ඉඩකඩ සඳහා බෝගය තරග කිරීම නිසා අස්වනු අඩු වීම / වල්පැළෑටි බීජ අස්වනු සමග මිශ්‍ර වීමෙන් අස්වනුවල ගුණාත්මය අඩු වීම / කටු සහිත වල් පැළෑටි නිසා ක්ෂේත්‍ර කටයුතු අපහසු වීම / වල් පැළෑටි මගින් කෘමි පළිබෝධ සඳහා වාසස්ථාන සැපයීම / රෝග කාරක ජීවීන්ට ධාරක ශාක ලෙස ක්‍රියා කිරීම **(ලකුණු 1/2×4 = 02)**

(b) ගඳපාන, යෝධ නිදිකුම්බා, පාතීනියම්, ජපන් ජබර, විඩේලියා, සැල්විනියා, පිලිපීන් ෆයර්වර්ක්ස් **(ලකුණු 1/2×2 = 01)**

(ii) (a) දියමලන් කැම **(ලකුණු 01)**
රෝග කාරකයා - රයිසොක්ටෝනියා, පිතියම්, ෆියුසේරියම් යන දිලීර වර්ග **(ලකුණු 01)**

(b) බීජ ප්‍රරෝහණය වී පසෙන් උඩට මතුවීමට පෙරම කුණු වීම, / මතු වූ පැළවල පාදස්ථයේ කළු දුඹුරු පාට පුල්ලි ඇතිවීම හා කඳ කඩා වැටීම / බීජ පත්‍ර හැකිලීම හා කළු පැල්ලම් ඇතිවීම **(ලකුණු 01×2 = 02)**

(iii) (a) ඉල් මැස්සා **(ලකුණු 01)**

(b) හානියට පත් වී බිමට වැටෙන ඵල ගැඹුරට වල දැමීම / ශාකය පාමුල පස අවුස්සා පිළවුන් විනාශ කිරීම / ඵල ආවරණය කිරීම / ක්ෂේත්‍රය වගා පොල් අතු වලින් ආවරණයක් සැකසීම **(ලකුණු 01×2 = 02)**

**(මුළු ලකුණු 10)**

6. (i) බිත්තර නිෂ්පාදනය අඩු ය.
* විලෝපික හානි වැඩි ය.
* පරපෝෂිත රෝග වැඩි ය.
* වැඩි ඉඩක් අවශ්‍ය ය.
* අසල්වැසියන්ගෙන් ගැටළු ඇති විය හැකි ය. **(ලකුණු 01×03 = 03)**

(ii) පහසුවෙන් සොයා ගත හැකි වීම, මිල අඩු වීම, පහසුවෙන් ගිනි නොගන්නා ද්‍රව්‍යයක් වීම, පාලනයට පහසු දූවිලිවලින් තොර ද්‍රව්‍යයක් වීම, කුකුළන් ආහාරයට නොගන්නා ද්‍රව්‍යයක් වීම, ජලය පහසුවෙන් උරා ගන්නා ද්‍රව්‍යයක් වීම **(ලකුණු 01×04 = 04)**

(iii) (a) බැක්ටීරියා **(ලකුණු 01×01 = 01)**

(b) බුරුල්ල ඉදිමී රත් පැහැ ගැනීම, උණුසුම් බවක් පෙන්වීම, බුරුල්ලේ තද ගතිය, අල්ලන විට වේදනාව ඇති බව පෙන්වීම **(ලකුණු 01×02 = 02)**

**(මුළු ලකුණු 10)**

7. (i) (a) සූර්ය තාපයෙන් වියළීම (උදා : වියළන ලද මිරිස්, හතු)
උදුනේ වියළීම (උදා : හතු, මිරිස්, එළවළු, පලතුරු)
විසිරි වියළීම (උදා : කිරි පිටි) **(ලකුණු 1/2× 2 = 01)**

(b) චීස් / යෝගට් / මුදවපු කිරි **(ලකුණු 1/2×2 = 01)**

(ii) (a) ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දේ/ ආහාරය සමග ප්‍රතික්‍රියා නොකරයි / තෙතමනය, වාතය බඳුනට ඇතුලු නොවේ/ නැවත නැවත භාවිත කළ හැකි ය/ පාරදෘශ්‍ය නිසා ආහාරය පාරිභෝගිකයාට බලාගත හැකි ය. **(ලකුණු 1/2×4 = 02)**

(b) ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම ඉහළ උෂ්ණත්වයකට ලක් කර එම උෂ්ණත්වයේ දී ම ආහාර ඇසුරුම් කරනු ලැබේ. **(ලකුණු 01)**
උදා : නැවුම් කිරි, පලතුරු යුෂ **(ලකුණු 01)**

(iii) (a) පොදු නාමය / නිෂ්පාදනයේ වෙළඳ නාමය / ශුද්ධ අන්තර්ගතයේ ප්‍රමාණය **(ලකුණු 01×02 = 02)**

(b) පිරිසිදු ඇල් ජලය අඩංගු බඳුනකට තේ කොළ දැමූ විට වර්ණක මිශ්‍ර කර ඇත්නම් එම වර්ණක ජලයේ දිය වී වර්ණය දිස් වේ. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**